රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SA/FR/02/04/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.03.27 |

**රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 04/2024**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු වෙත

<u>ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනීකරණය</u>

2028 වර්ෂයේ සිට පූර්ණ උපචිත පදනම යටතේ ගිණුම්කරණ ක්‍රමවේදයක් අනුගමනය කිරීමේ අපේක්ෂාවෙන්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 4 ට අනුකූලව දේශීය හා විදේශීය ණය ගැනීම් යටතේ සුදුසුකම් ලත් වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිපදවීම සම්බන්ධයෙන් දරන ලද ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා 2013.11.29 දිනැති අංක 230/2013 චක්‍රලේඛය මගින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇත.

කෙසේ වෙතත්, රටේ පවතින වත්මන් ආර්ථික තත්ත්වය හේතුවෙන්, පූර්ණ උපචිත පදනම යටතේ ගිණුම්කරණ ක්‍රමවේදය අනුගමනය කිරීමේ කාලය දීර්ඝ කිරීම සඳහා ඉහත සැලැස්ම නැවත සලකා බලන ලදී. දැනට අනුගමනය කරනු ලබන වැඩිදියුණු කරන ලද මුදල් පදනම මත වන ගිණුම්කරණ ක්‍රමයේ සිට පූර්ණ උපචිත පදනමක් දක්වා මෙම පරිවර්තන ක්‍රියාවලිය පහසු ක්‍රියාවලියක් බවට පත් කිරීම සඳහා අදියර ගණනාවක් ක්‍රියාත්මක කළ යුතු ය. පරිවර්තන ක්‍රියාවලිය පහසුකර ගැනීම සඳහා ප්‍රධාන සන්ධිස්ථාන කිහිපයක් අභ්‍යන්තරව සම්පූර්ණ කළ යුතු ය.

එතෙක්, ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනීකරණය සඳහා වන ඉහත සඳහන් චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
2. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව   பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை.   General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600   Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail : dgsa@sad.treasury.gov.lk